- To evaluate the effectiveness of SDI service.

Methodology

Research questions :

1. Does the Researcher aware on SDI service?

2. What are the Researchers opinions on SDI service?

3. Effectiveness of the SDI service provided by the ISC?

Method

In literature many methods and techniques are reported on data collection. Among them questionnaire survey was found to be very popular and useful technique for collecting data related to the users and their information needs (Kannappanavar & Swamy, 2013).   Therefore, Quantitative research method is adapted for the present study.

Study population – Research Staff of the ITI

The staff of the ITI is categorized as Research, Technical, Administration & Clerical, Craftsmen, Management and Others (Aides, Helpers, drivers etc.).

The Research Staff of the Industrial Technology Institute was selected for the survey. The Research Staff is divided into two categories as Scientists and Engineers. A list of researchers was obtained from the Human Resources Department of ITI.

Expertise of research staff

In the areas of Food and Herbal Technology, the Institute has considerable expertise in food and herbal products development and analysis, food processing, post-harvest technology, microbiology, plant tissue culture, medicinal and aromatic plants and essential oils and spices. In the Materials field, ceramics, cement, rubber, plastics, wood and petroleum technology are the areas in which ITI has expertise. In the Environmental area our strength lies in industrial pollution control – solid, air and water including waste water, energy and environmental monitoring including noise and vibration monitoring.

As one of the leading testing and measurement laboratories in the country, ITI has analytical expertise in analytical, chemical, microbiological and physical testing of variety of fields. ITI is also one of the few laboratories in the country that provide calibration and measurement services. Over the years our laboratory staff has also developed expertise in laboratory quality management systems. The Research staff also has expertise in information management and corporate management. (ITI Annual Report 2015).

Research instrument

A structured questionnaire was used as the research instrument for the survey. The questionnaire consists of 21 question, in which 18 were closed and for 3 questions, structured answers has to be provided. Out of 21 questions 12 questions were designed to get information on Selective Dissemination Information (SDI) service and the remaining questions were on general information about the researcher and on the resources available. This paper evaluates only the SDI service carried out at ISC.

Data analysis method

The results were tabulated and analyzed according the basic statistical methods such as percentages, graphs, pie charts etc. using Microsoft Excel.

Results and Data Analysis

As mentioned in the introduction, only the Research Staff of ITI was selected for the survey. All 83 Research officers were selected for the survey. Duly completed questionnaires, which received within the given time frame were taken for the analysis. The response rate was approximately 84%, 69 researchers out of 83 researchers had answered the questionnaire. The results were calculated for these 69 respondents.

Category analysis

There were 55 Research Scientists and 14 Research Engineers among the study population. (Figure 1.)

Figure 1: Category wise Research Staff

Information Communication Technology background

All the researches were provided with a computer by the Institute for their own used and none of the computers are shared with any other. Every researcher has an official email account and access to internet.

Evaluation of Selective Dissemination Information (SDI) service

Aware of the service

Out of 69 responses, only 49 were aware of SDI service while 20 were not aware of the service. It showed that the recently joined research staff were not aware of the SDI service. (Figure 2)

Figure 2 : Awareness on SDI service

Receiving SDI alerts

The 49 respondents who were aware of the service had answered that they receive SDI alerts via email. 18 had answered that they don't receive SDI alerts and 2 had not answered the question. Number and the percentage of respondents who receive SDI alerts via email have shown in Table 1 and Figure 3.

Table 1: Number of researchers receiving SDI alerts

Yes	No	Not Responded	Total
49	18	2	69

Figure 3: Percentage of receiving SDI alerts

Reading SDI alerts

Only 40 respondents read the SDI alerts receive through emails. It showed that not even half of the entir research staff of 83 read the SDI related emails. (Table 2)

Table 2: Reading SDI alerts receive through email

Yes	No	Don't' know SDI service	Didn't answer questionnaire	Total
40	09	20	14	83

Relevancy of SDI alerts

For the question on relevancy of SDI alerts, 5 answered that it is very useful while 25 answered as useful or moderately useful. Others answered as it is inconsequential to them. 25 have answered that they request articles and books via SDI alerts while others do not. The survey showed that the researchers who answered the service useful are engaged in R & D activities. (Table 3 and Figure 4)

Table 3: Relevancy of SDI alerts

Very useful	Useful	Moderately useful	Inconsequential
5	14	11	7

Figure 4: Relevancy of SDI alerts

SDI alerts request by respondents:

Frequency of respondents' requests for SDI alerts is shown in the Table 4. 30 researchers answered that they respond to the email alerts while 19 answered they don't respond the SDI alerts.

Table 4: Frequency of SDI requests by respondents

SDI alerts	Yes	No
Requests	30	19

Effectiveness of the service:

According to the Key Performance Indicator used to measure the effectiveness of the service 34 had answered that the SDI service is moderately satisfied. 7 respondents answered as very satisfied service while 6 answered as poor. 2 respondents had not responded to the question while nobody answered for the "Extremely satisfied" indicator. (Figure 5)

Figure 5: Effectiveness of the SDI Service

Rating of the SDI service:

On rating of the SDI service, 44 respondents had rated as either excellent, good or fair while 5 respondents had rated the service as poor. 10 rated the service as "don't know". (Figure 6)

Rating about the SDI service

Figure 6: Rating about the SDI service

Opinion on SDI Service:

The respond for the question on their opinion on the SDI service was given by only 24 researchers. Majority of them had appreciated the service and mentioned to be useful and articles are relevant for their research as well as in writing proposals for research grants. There were requests to get access to more online resources such as journal databases and e-books. Also, to update the researches with new books from catalogues and to conduct a survey for required books. The need to update the collection with new editions of books was another request. There was a comment on unavailability of updated scientific literature and information provided through SDI was not relevant to work carried out at ITI. A suggestion to conduct periodical awareness programmes and to update the user profiles was given by one respondent.

Conclusion and Recommendation

The study revealed that the about half of Research staff were aware of the SDI service and found it to be useful for their research work. But most of the recently joined junior research staff and researchers from testing laboratories are not aware of the service. The usage of this service can be increased by educating the researchers about the SDI service.

Orientation programmes to make the researchers aware of the service should be organize periodically. However, the service can be improved by carrying out more in-depth surveys on user requirements taking into consideration individuals belong into different divisions, their subject interests, their educational levels, their category in the organization so that more specialized responses could be obtained. With this information, the SDI service could be improved to cater the requirements of the ITI employees.

Recommendations

1. It is recommended to consider the SDI statistics of number of SDI alerts sent, number replied to the email alerts and the number of requests and to take necessary steps if the alerts are not receiving properly.

2. The usage of this service can be increased by educating the researchers about SDI service.

3. The staff of ISC should visit the divisions and provide the necessary training to the research staff while updating their research interest biannually.

4. It is recommended to introduce more information technological tools such as e-database, e-journals, e-books, blogs and portals etc.

5. After introducing the above the effectiveness and the usage of SDI service should be evaluated annually.

6. Orientation programmes for new recruits should be conducted.

References

Abeyesekera, K. H. T. (2013). *Identification of the information needs of local herbal industry using critical success factors approach.* [Master's thesis in Library and Information Science (MLS)]. National Institute of Library and Information Science, University of Colombo, Sri Lanka.

Industrial Technology Institute. (2015). *ITI Annual Report 2015*. Colombo, Sri Lanka.

Kannappanavar, B. U., & Swamy H. M. C. (2013). User's perception and opinion towards CAS and SDI services in agricultural science university libraries in India, with special reference to South India: An evaluative study. *International Journal of Library and Information Science*, *5*(10), 342-350.

Koubarakis, M., Tryfonopoulos, K., Idreos, S., & Drougas, Y. (2003). Selective Information Dissemination in P2P Networks: Problems and Solutions. *SIGMOD Record*, *32*(3), 71-76.

Sahu, M. K. (2013). Information disseminating through using social Networking sites among library professional in the Engineering colleges of Odisha: A survey. *International Journal of Digital Library Services, 1,* 45-95.

Warnasuriya, D. (1985). Mini Survey on the use of the CISIR Library Sri Lanka, *Library Review 1*(1), 31.

An Investigative Study of Online Learning of Performing Arts Subjects during the COVID-19 Virus Expansion Period

(Based on the study activities of Bharatanatyam Dance Course, 2014-2015 Study Group, Department of Indian and Asian Dance, University of the Visual & Performing Arts, Colombo, during the COVID-19 Virus Outbreak)

K. C. Sampath Silva[1]

The impact of the global pandemic caused by the COVID-19 virus has affected the entire social structure and created a crisis in the field of Performing Arts education. Bharatanatyam dance style is an art that should be studied under strict discipline in the presence of a teacher. During this period, these courses at the University of Visual and Performing Arts were conducted as online lecture sessions and the purpose of this research is to conduct a detailed quality analysis of this learning-teaching process. The problem with this research was whether Bharatanatyam dance have the potential to reach the desired level of learning by learning in an online and virtual learning environment outside of the traditional learning-teaching process. Primary and Secondary data were used under the qualitative quantitative research methodology for this study. A SWOT analysis of this learning process was conducted based on participatory observations, interviews, and field study on Bharatanatyam dance learning online. Also a questionnaire was given to ten students who participated in learning Bharathantyam dance online and identified their problems with online study. 80% of them are moderately satisfied with learning Bharatanatyam dance online and 20% are not satisfied. It was revealed that studying Bharatanatyam dance online affects the quality of the student's academic knowledge, the relationship between the limbs of the dance as well as the difficulty in understanding the gestures and facial expressions, tastes (rasas), use of signs (mudras), lack of learning outcomes and threats. Also lack of practicality in assigning cultural features related to dance to students in a virtual learning environment and incomplete development of the skills and personality development expected of the student by the subject of dance. Technophobia, Stress, communication and technical problems were also reported to have disrupted the online dance learning process. There are opportunities and strengths in the online learning process such as ability to implement internationally intercultural exchange programmes, being able to study Bharatanatyam dance across geographical boundaries, and being able to use online learning to develop self-study skills in students.

[1] University of the Visual & Performing Arts, Sri Lanka.

Email : chamarasampath228@gmail.com

Also, online dance education helps to students for presenting virtual dance performances, empowering student-centered learning and become active learners. Thus, the study concludes that there are both positive and negative reactions to studying Bharatanatyam dance online and that the courses should be reformed to suit the online system while maximizing the existing advantages and minimizing the disadvantages.

කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ති සමයෙහි ප්‍රාසාංගික කලා විෂයයන් මාර්ගගත ක්‍රමයෙන් ඉගෙනීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ති සමයේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ, ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශයේ 2014-2015 අධ්‍යයන කණ්ඩායමේ භරතනාට්‍යම් නර්තන පාඨමාලාවේ අධ්‍යයන කටයුතු ඇසුරින්)

හැඳින්වීම

කොවිඩ්-19 වෛරසය හේතුවෙන් උද්ගත වූ ගෝලීය වසංගත තත්ත්වය සමස්ත ශ්‍රී ලංකාවටම අහිතකර බලපෑම් එල්ල කරන ලද අතර එයින් මෙරට සමාජ, සෞඛ්‍ය, ආර්ථික, දේශපාලන, අධ්‍යාපන ආදී අංශ ගණනාවකම උග්‍ර ගැටලු රාශියක් පැණනැගින. කොවිඩ්-19 වෛරසය සමාජගත වීම වැළැක්වීම සඳහා පිළියමක් වශයෙන් 2020 වර්ෂයේ මාර්තු හා අප්‍රේල් මාසවල දී ශ්‍රී ලංකාවේ නිරෝධායන ඇඳිරිනීතිය පනවන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2020 මාර්තු 12 වන දින සිට ශ්‍රී ලංකා රජය විසින් රාජ්‍ය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 55ක් තාවකාලිකව වසා දමන ලදි. මේ හේතුවෙන් මෙරට අධ්‍යාපන පද්ධතිය තාවකාලික අකර්මණ්‍ය වූ අතර ඒ සඳහා විකල්ප ක්‍රමවේදයක් ලෙස මාර්ගගත අධ්‍යාපනය හඳුන්වා දෙනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ව්‍යුහය මාර්ගගත තෘතීය අධ්‍යාපන ප්‍රවේශයක් දක්වා විශිෂ්ට හා වේගවත් ලෙස විතැන් විය. සමස්තයක් ලෙස කොවිඩ් -19 වසංගත සමයේ දී අධ්‍යයන කටයුතු යාවත්කාලීන කිරීම සඳහා විශ්වවිද්‍යාලයන්හි සෑම පීඨයක්ම දුරස්ථ අධ්‍යාපන විධි ක්‍රමයක් වශයෙන් මාර්ගගත අධ්‍යාපනය ලබා දීමේ පළමු අත්දැකීම ලැබූ අතර මෙම කාල සීමාවේ දී ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ව්‍යුහයන්හි සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය නව තාක්ෂණය සමඟින් නවීකරණය වීම සිදු විය (Hayashi, R., Maddawin, A., Garcia, M., Hewagamage, K. P., 2020).

මෙම නව අධ්‍යයන ප්‍රවේශය හේතුවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ද බොහෝ සංකීර්ණතා ඇති වූ අතර ප්‍රාසාංගික කලා අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයේ අර්බුදකාරී වාතාවරණයක් නිර්මාණය වීමට ද හේතු විය. මේ හා සමගාමීව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ප්‍රාසාංගික කලා පාඨමාලාවන් ද මාර්ගගත දේශන සැසි වශයෙන් පැවැත්වීණි. මේ සම්බන්ධව ධනාත්මක මෙන්ම සෘණාත්මක ප්‍රතිචාර පවතින බව හඳුනාගත හැකිය. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය වනාහි ප්‍රාසාංගික හා දෘශ්‍ය කලාවන් පිළිබඳ විශේෂ උපාධි පිරිනමනු ලබන ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලයකි. මෙහි නර්තන හා නාට්‍ය කලා පීඨය, සංගීත පීඨය, දෘශ්‍ය කලා පීඨය හා පශ්චාත් උපාධි පීඨය නමින් පීඨ හතරක් වන අතර මෙහි පවත්වනු ලබන සියලු පාඨමාලා ප්‍රායෝගික විෂය ක්ෂේත්‍ර සමඟ තදානුබද්ධ වන බැවින් මාර්ගගත ක්‍රමවේදයන්ට අනුව එකී ප්‍රායෝගික දේශන පැවැත්වීම අභියෝගයක්ව පැවති බව හඳුනා ගත හැකිය.

මෙම අධ්‍යයනයේ දී ප්‍රමුඛව සලකා බැලෙනුයේ කොවිඩ් - 19 වෛරසය ව්‍යාප්ති සමයේ දී සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශයේ 2014-2015 අධ්‍යයන කණ්ඩායමේ අවසන් වසර භරතනාට්‍යම් නර්තන පාඨමාලාව මාර්ගගත ක්‍රමයෙන් ඉගෙනීමේ දී විද්‍යාර්ථීන් ලද අත්දැකීම් පිළිබඳවය.

මෙහි දී මෙම මාර්ගගත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි පවති ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ තත්ත්ව විශ්ලේෂණයක් මෙන්ම ප්‍රාසාංගික කලා විෂය ක්ෂේත්‍රය යටතේ හරතනාට්‍යම් නර්තන විෂය මාර්ගගත අධ්‍යාපනය සමග සංවර්ධනය කිරීම පිළිබඳ මතවාදයක් ගොඩනැගීමත් මෙම මාර්ගගත දේශන ක්‍රමය කොවිඩ්-19 සමයට පමණක් සීමා නොකොට මෙහි පවත්නා වාසි උපරිම කරගනිමින් අවාසි අවම කර ගනිමින් අනාගතයට යාවත්කාලීන කිරීමේ වැදගත්කම පෙන්වා දීමත් මෙම අධ්‍යයනයේ දී අපේක්ෂා කෙරේ.

පර්යේෂණ අරමුණු

- මාර්ගගත දේශන සැසි වශයෙන් පවත්වන ලද හරතනාට්‍යම් නර්තන පාඨමාලාවේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ විස්තරාත්මක තත්ත්ව විශ්ලේෂණයක් සිදුකරමින් මෙහි පවත්නා ශක්තීන් (Strengths), දුර්වලතා (Weaknesses), අවස්ථා (Opportunities) හා තර්ජන (Threats) හඳුනා ගැනීම.

- හරතනාට්‍යම් විෂය සංවර්ධනය සඳහා මාර්ගගත අධ්‍යාපන ක්‍රමවේදය භාවිතයට ගත හැකි ආකාරය විමසීම.

- මාර්ගගත හරතනාට්‍යම් නර්තන පාඨමාලාවන්හි ගැටලු අවම කර ගැනීම සඳහා වන විසඳුම් සාකච්ඡා කිරීම.

පර්යේෂණ ගැටලුව

හරතනාට්‍යම් නර්තනය සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙන් බැහැරව මාර්ගගත හා අතත්‍ය ඉගෙනුම් පරිසරයක් තුළ සිදුකිරීමෙන් අපේක්ෂිත ශක්‍යතා මට්ටම කරා ළඟා වීමට හැකියාවක් පවතී ද යන්න පර්යේෂණ ගැටලුව වේ.

උපන්‍යාසය

හරතනාට්‍යම් නර්තනය සාම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙන් බැහැරව මාර්ගගත හා අතත්‍ය ඉගෙනුම් පරිසරයක් තුළ සිදුකිරීමෙන් අපේක්ෂිත ශක්‍යතා මට්ටම කරා ළඟා වීම දුෂ්කර වේ.

පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය හා ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ අධ්‍යයනයට අදාළ ප්‍රාථමික හා ද්විතීයික දත්ත එක්රැස් කිරීම සඳහා සහභාගීත්ව නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, අන්තර්ජාල ප්‍රකාශන පිරික්සීම, පර්යේෂණ ලිපි හා පුවත්පත් වාර්තා යනාදී පර්යේෂණ ක්‍රම භාවිත කරන ලදි. එමෙන්ම ප්‍රමාණාත්මක දත්ත එක්රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලී ක්‍රමය භාවිතයට ගන්නා ලදි. මෙහි දී හරතනාට්‍යම් නර්තනය මාර්ගගතව ඉගෙනීම සඳහා සහභාගී වූ විද්‍යාර්ථීන් සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡා මගින්

රැස්කර ගත් දත්ත හා ඔවුන් වෙත ලබා දෙන ලද ප්‍රශ්නාවලියට ලබා දුන් ප්‍රතිචාර විශ්ලේෂණය කරමින් මෙම ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳ විශ්ලේෂණයක් (SWOT analysis) සිදුකරමින් නිගමනවලට එළඹෙන ලදි.

පර්යේෂණ සීමාවන්

මෙම පර්යේෂණයේ දී 2020-05-01 සිට 2020-07-20 දින දක්වා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ඉන්දීයානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශයේ 2014-2015 අධ්‍යයන කණ්ඩායමේ උපාධි අවසන් වසර හරතනාට්‍යම් නර්තන පාඨමාලාවේ ප්‍රායෝගික දේශන මාර්ගගත ක්‍රමයට ඉගෙනුම්-ඉගැන්වීම් හා සම්බන්ධ ක්‍රියාවලිය පර්යේෂණ සීමා ලෙස යොදා ගන්නා ලදි.

සාහිත්‍ය විමර්ශනය

■   කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ති සමයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රියාවලිය

කොවිඩ්-19 වෛරසය චීනයේ හුබෙයි පළාතේ අගනුවර වූ වූහාන් නගරයෙන් 2019 දෙසැම්බර් මස 27වන දින ආරම්භ වී ගෝලීය වසංගතයක් දක්වා ව්‍යාප්ත වූ අතර මෙම තත්ත්වය හේතුවෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ගෝලීය හදිසි තත්ත්වයක් ද ප්‍රකාශයට පත් කරන ලදි. මෙම අනපේක්ෂිත වසංගතය හමුවේ ලොව පුරා රටවල සමාජීය, සෞඛ්‍ය, ආර්ථික, දේශපාලන, සංචාරක, අධ්‍යාපන ආදී අංශයන්හි අස්ථාවරත්වයන් මෙන්ම සියලු සමාජ සබඳතා අකර්මණ්‍ය විය. මෙහි බලපෑම මගින් කොරෝනා වෛරස් ව්‍යාප්ති සමයේ දී තාවකාලිකව අධ්‍යාපන ආයතන වසා දැමුණු අතර එමගින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ද විශාල කඩා වැටීමක් සිදු විය. ලෝකය පුරා රටවල් 192ක පමණ 2020 මාර්තු මාසයේ අවසාන සතියේ සිට දළ වශයෙන් ප්‍රාථමික සිට තෘතියික අධ්‍යාපන මට්ටම දක්වා සිසුන් බිලියන 1.7ක් පාසල් නොයන බව ගෝලීය සංඛ්‍යා ලේඛනවලින් හෙළි වේ (UNESCO, 2020). එමෙන්ම යුනෙස්කෝව විසින් මෙම කාල සීමාවේ දී විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන කටයුතු නිවෙස්වල සිට දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේද ඔස්සේ යාවත්කාලීන කරන ලෙස ගෝලීය නිවේදනයක් ද නිකුත් කරන ලදි (United Nations, 2020). කෝවිඩ්-19 වෛරස් ව්‍යාප්ති සමයේ දී එහි බලපෑම භාෂාව, සාහිත්‍ය, දර්ශනය, ආගම, ලලිත කලා, සමාජ විද්‍යා වැනි ලිබරල් කලාවන්ට බෙහෙවින් බලපා ඇති අතර විශ්වවිද්‍යාලයන්හි සියලු බාහිර ක්‍රියාකාරකම් ඇණහිට තිබේ (Liyanage, 2020).

කොරෝනා වෛරස වසංගතය ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා ප්‍රතිචාරයක් ලෙස ශ්‍රී ලංකාවේ සියලු උසස් අධ්‍යාපන ආයතන වසා දැමීමෙන් අනතුරුව උසස් අධ්‍යාපන ක්‍රියාවලිය යාවත්කාලීන කිරීම සඳහා දේශන ශාලාව තුළ සිදුකරනු ලැබූ සාම්ප්‍රදායික අධ්‍යාපන රටාවෙන් බැහැරව මාර්ගගත ක්‍රමයට අධ්‍යාපනය ලබා දීම හා ලබා ගැනීම මගින් මාර්ගගත තෘතීයික අධ්‍යාපනයකට ශ්‍රී ලංකාව ඉතා වේගවත් හා විශිෂ්ට අනුගත වීමක් දක්නට ලැබිණ.

ආසියානු සංවර්ධන බැංකු වාර්තාවට අනුව කොවිඩ්-19 වෛරස් ව්‍යාප්ති සමයේ දී ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ලබන සිසුන්ගෙන් 88%ක් මාර්ගගත අධ්‍යාපනය සඳහා ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී ඇති බවත් ඉන් 90%ක සිසුන් ප්‍රමාණයක් මාර්ගගත අධ්‍යාපනය පිළිබඳ සෑහීමකට පත් වන බවත් අනාවරණය වී ඇත. එම ආයතනය මගින් සමීක්ෂණය කරන ලද විශ්වවිද්‍යාල සිසුන්ගෙන් 90%ක ප්‍රමාණයක් සඳහා මාර්ගගත අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රවේශ වීමට අවශ්‍ය පහසුකම් පවතින බවත් තහවුරු විය. මෙම අනුපාතය ජපානය වැනි ලෝකයේ සංවර්ධිත රටවලට සාපේක්ෂව සමානුපාත වේ. 2020-06-01 දින වන විට ජපානයේ 90.3%ක් විශ්වවිද්‍යාල සිසුන් දුරස්ථ අධ්‍යාපනය සඳහා යොමු වී ඇති බව අනාවරණය වී ඇත (Hayashi, R., Maddawin, A., Garcia, M., Hewagamage, K. P., 2020).

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ, ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශයේ ද මේ හා සමගාමීව මාර්ගගත ප්‍රායෝගික දේශන සංවිධානය කළ අතර මෙම දේශන සඳහා ශිෂ්‍ය සහභාගීත්වය 100%ක් ලෙස පැවතිණ. එමෙන්ම හරතනාට්‍යම් නර්තන පාඨමාලාවට අදාළ ඇගයීම් හා පැවරුම් ද මාර්ගගත ආකාරයෙන් සිදු කරන ලදි. මෙම මාර්ගගත අධ්‍යයන හා ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව ධනාත්මක මෙන්ම සෘණාත්මක ප්‍රතිචාර හඳුනාගත හැකි විය. සමස්තයක් වශයෙන් උසස් අධ්‍යාපන ආයතනයන්හි මාර්ගගත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා සම්බන්ධ පළමු අත්දැකීම මෙම අවස්ථාව වූ බැවින් එහි යම් යම් දුර්වලතා ද තිබෙනු දැකිය හැකි විය.

■   **දුරස්ථ අධ්‍යාපනයේ ඓතිහාසික පසුබිම**

දුරස්ථ අධ්‍යාපනය දිගු ඉතිහාසයක් පවතින අතර ලිපි හුවමාරුව මගින් ඉගෙනීම, ගුවන් විදුලිය රූපවාහිනී විකාශය හරහා ඉගෙනීම, සංයුක්ත තැටි හරහා ඉගෙනීම, අන්තර්ජාලය පදනම් කරගත් ඉගෙනුම, ජංගම ඉගෙනුම හෙවත් දුරකථන මාර්ග යෙන් ඉගෙනීම යනාදි වශයෙන් දුරස්ථ අධ්‍යාපනය විවිධ යුගයන්හි විකාශය වෙමින් සංවර්ධනය වී ඇත (Stern, 2020).

සන්නිවේදන ක්‍රමයන්හි සංවර්ධනීය යුගයන් අනුව දුරස්ථ අධ්‍යාපනය ද කලින් කල වෙනස් වී ඇති බව හඳුනාගත හැකි ය. කප්ලන් සහ මයිකල් විසින් දුරස්ථ අධ්‍යාපනයේ සංවර්ධනීය යුග තුනක් හඳුන්වා දී ඇත.

1. මුද්‍රණද්වාරයෙන් දුරස්ථ අධ්‍යාපනය ක්‍රියාත්මක වීම - 1728 දී Print Boston ගැසට් පත්‍රය මගින් තැපැල් මාර්ගයෙන් ක්‍රියාත්මක වන දුරස්ථ Stenography පාඨමාලාවක් සඳහා නිවේදනයක් නිකුත් කරන ලදි.
2. රූපවාහිනිය මගින් දුරස්ථ අධ්‍යාපනය ලබා දීම - 1969 දී UK Open University මගින් තැපැල හා රූපවාහිනිය හරහා දුර බැහැර සිටින ශිෂ්‍යයන්ට කෙටි පාඨමාලා හා උපකාරක පංති සඳහා සහභාගී වීමට අවස්ථාව සලසා දෙන ලදි.
3. මාර්ගගත අධ්‍යාපනයේ ආරම්භය - 1989 දී ගියොනික්ස් විශ්වවිද්‍යාලය මාර්ගගත විශ්වවිද්‍යාලයක් ලෙස ස්ථාපිත විය. එමගින් ප්‍රථම උපාධි හා ශාස්ත්‍රපති උපාධි ලබා දෙන ලදි (Andrew, K.,) Mickel, H., 2016).

■   මාර්ගගත අධ්‍යාපනය

මාර්ගගත ඉගෙනුම යනු අන්තර්ජාලය හරහා සිදුවන අධ්‍යාපනයයි. එය ඊ-ඉගෙනුම ලෙස ද හැඳින්වේ (Online Education, 2020). එමෙන්ම අතථ්‍ය අධ්‍යාපනය (Virtual Education), අන්තර්ජාලය පදනම් කරගත් අධ්‍යාපනය (Internet Based Education), වෙබ් පාදක අධ්‍යාපනය (Web-based Education), පරිගණක මැදිහත් සන්නිවේදනය තුළින් ලබන අධ්‍යාපනය (Education via computer mediated communication) යනාදී නම්වලින් මාර්ගගත අධ්‍යාපනය හඳුන්වනු ලැබේ (Paulsen, 2020).

මාර්ගගත ඉගෙනුම යනු විවෘත හා දුරස්ථ අධ්‍යාපන විධි ක්‍රමයකි. සාම්ප්‍රදායික පන්ති කාමරයක සීමිත සීමාව ඉක්මවමින් බහු මාධ්‍ය තාක්ෂණය යොදා ගනිමින් සිදු කෙරෙන මාර්ගගත අධ්‍යාපනය නැතහොත් විද්‍යුත් අධ්‍යාපනයේ දී ඕනෑම ප්‍රමාණයක දුරින් සිටින බෙහෝ සිසුන් පිරිසකට එකවර එම සේවය ලබා ගැනීමේ පහසුව හිමි වේ (Stern, 2020).

තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමග දුරස්ථ අධ්‍යාපන ක්‍රමය ඉතා ජනප්‍රිය විය. පන්තිකාමරයේ ගුරුවරුන් හා සිසුන් අතර පැවති සාම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රියාවලිය පසු කාලිනව දුරස්ථ අධ්‍යාපනය දක්වා වැඩි දියුණු වූ අතර වර්තමානයේ දී දුරස්ථ අධ්‍යාපනයේ නවතම පෙරළිය වන්නේ මාර්ගගත ක්‍රමවේද භාවිතයෙන් අධ්‍යාපනය ලබා දීම හා ලබා ගැනීම වන අතර එය ඉතා පහසු හා නම්‍යශීලී ඉගෙනුම් ක්‍රමයක් බවට පත්ව ඇත (Tehrani, 2008). මෙහිදී ගුරුවරයා හා සිසුන් තම තමන්ට පහසු ස්ථානවල සිට සටහන් හා උපදෙස් ලබා දීම හා ලබා ගැනීම කළ හැකි ය (Online Education, 2020). දුරස්ථ අධ්‍යාපනයේ එක් ක්‍රමයක් වන මාර්ගගත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ස්වාභාවය අධ්‍යයනය කිරීම ද මෙහි දී වැදගත් වේ.

ඇන්ඩර්සන් හා ඩ්‍රොන් ප්‍රකාශ කරන පරිදි දුරස්ථ අධ්‍යාපනය යනු ස්ථානය හා වේලාව නොතකා තාක්ෂණික මැදිහත්වීමක් සහිත ඉගෙනීමකි. මාර්ගගත අධ්‍යාපනය පිළිබඳ ඩෙස්මන්ඩ් කීගන් (1988) නිර්වචනයට අනුව මාර්ගගත අධ්‍යාපනයේ මූලික ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකි ය.

■   අධ්‍යාපනික අන්තර්ගතයන් ඉදිරිපත් කිරීමට හෝ බෙදා හැරීමට පරිගණක ජාලයක් භාවිත කිරීම.

■   ගුරුවරුන් හා ශිෂ්‍යයන් මුහුණට මුහුණලා අධ්‍යාපනයෙන් වෙන් කිරීම.

■   පරිගණක ජාල හරහා ගුරුවරුන් හා ශිෂ්‍යයන් අතර සිදුවන ද්වී මාර්ගික සන්නිවේදන ක්‍රියාවලිය.

■   ස්වයං අධ්‍යයන ක්‍රියාවලිය (Keegan, 1988).

මාර්ගගත අධ්‍යාපනය නම්‍යශීලී හා උපදේශාත්මක දැනුම බෙදාහැරීමක් වේ (අතුකෝරළ, 2019). මෙම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ගුරුවරුන් හා සිසුන් වෙන්ව සිටින අධ්‍යාපන ක්‍රමයක් ලෙස ද හැඳින්විය හැකිය (අතුකෝරළ, 2019).

මාර්ගගත අධ්‍යාපනයේ දී සාම්ප්‍රදායික දේශනයක් සිදුවන ආකාරයටම ගුරුවරයා හා ශිෂ්‍යයා අතර සන්නිවේදනයක් සිදු වේ. ගුරුවරයා උගන්වන අතරතුර දී ම එම තොරතුරු හා දැනුම ශිෂ්‍යයා ග්‍රහණය කරගන්නා අතර ගැටලු හා ප්‍රශ්න සාකච්ඡා කිරීම ද සිදු වේ (සේනාධීර, 2020). Moodle" Blackboard" E-College, ETUDES-NG, Angel වැනි වෙබ් අඩවි (පාඨමාලා කළමණාකරණ පද්ධති) මෙන්ම Google classroom, Microsoft team, Google meet, ZOOM වැනි සජීවී වීඩියෝ සන්නිවේදන මෘදුකාංග මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලිය කළමණාකරණ කිරීම සඳහා භාවිත වේ. දියුණු රටවල බොහෝ කලක පටන් අන්තර්ජාලය මත පදනම් වූ ඉගැන්වීම් ක්‍රමවලට යොමු වී ඇතත් ලාංකේය සමාජයට මෙම මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලිය නවමු අත්දැකීමක් බවට පත් විය (යටිගම්මන, 2020). මේ සඳහා ධනාත්මක මෙන්ම සෘණාත්මක ප්‍රතිචාර පවතී.

මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ප්‍රධාන සාධක තුනක් හඳුනාගත හැකි ය. එම සාධක සම්පූර්ණ වීමෙන් මාර්ගගත අධ්‍යාපනය සඳහා අත්‍යවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ වේ.

1. විධිමත් ඉගෙනුම් කළමණාකරණ පද්ධතියක් තිබිය යුතු ය.
2. වේගවත් අන්තර්ජාල පහසුකම් තිබිය යුතුය.
3. අන්තර්ජාලයට පිවිසීම සඳහා අවශ්‍ය තාක්ෂණික මෙවලම් තිබිය යුතු ය (සේනාධීර, 2020).

මාර්ගගත අධ්‍යාපනය ලැබිය හැකි ප්‍රවේශයන් රාශියක් වන අතර පහත දැක්වෙන්නේ වර්තමානයේ ජනප්‍රිය හා සුලභ ප්‍රවේශයන් කිහිපයකි. උසස් අධ්‍යාපන ආයතන විසින් කෝවිඩ්-19 සමයේ දී සිය ආයතනයන්හි අධ්‍යයන කටයුතු යාවත්කාලීන කොට පවත්වා ගෙන යාම සඳහා බෙහෝ සෙයින් මෙකී ප්‍රවේශ යටතේ අධ්‍යාපනය ලබා දීමේ වැඩසටහන් නිර්මාණය කිරීම නිරීක්ෂණය කළ හැකි විය.

- ඉගෙනුම් කළමණාකරණ පද්ධති (Learning Management System)
- WhatsApp, Viber, Zoom, Skype වැනි මෘදුකාංග
- සමකාලීක මාර්ගගත පාඨමාලා ක්‍රමය (Synchronous online courses)[1]
- සමකාලීක නොවන පාඨමාලා ක්‍රමය (Non synchronous courses.)[2]
- මිශ්‍ර මාර්ගගත පාඨමාලා (Blended Online courses) (සේනාධීර, 2020).

මාර්ගගත අධ්‍යාපනයේ පවත්නා වාසි හා අවාසි රාශියක් හඳුනාගත හැකි ය. පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව, ස්වයං ඉගෙනුම, සංජානනය දියුණු කිරීම, පිරිවැය අවම වීම,

---

[1] සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමවේදවලට විකල්පයක් ලෙස යොදා ගනී. මෙහි දී ඉගැන්වීම හා ඉගෙනීම යන ක්‍රියාවලිය තථ්‍යකාලීනව සිදුවිය යුතු ය. මෙය සජීවී ඉගෙනුම් ක්‍රියාවලියකි. රැස්වීම්, සාකච්ඡා, සම්මන්ත්‍රණ ආදියට ද මෙම තාක්ෂණය මත පදනම් වූ සන්නිවේදනය බහුලව යොදා ගනු ලැබේ. උප-දේශකවරයා හා ශිෂ්‍යයා එකවර මේ සම්බන්ධ වන අතර ක්ෂණික ප්‍රතිචාර සහිත වේ.

[2] මෙහි දී ඉගැන්වීම හා ඉගෙනීම යන ක්‍රියාවලිය තථ්‍යකාලීනව සිදුවිය යුතු නැත. සිසුන්ට පහසු අවස්ථාවල දී භාවිතය සඳහා ලිඛිත හා ශ්‍රව්‍ය දෘශ්‍ය ඉගෙනුම් සම්පත් තොරතුරු තාක්ෂණ පද්ධතිවල පවත්වගෙන යාම මෙහි දී සිදු වේ. මෙය බොහෝ දුරට ශිෂ්‍ය කේන්ද්‍රීය වේ. ස්වාධීන හා ස්වයං ඉගෙනුමකි.

පර්යේෂණශීලීත්වය ප්‍රවර්ධනය කළ හැකිවීම, මූලික පරිගණක දැනුම දියුණු වීම, සැමට සම අවස්ථා හිමි වීම, පුද්ගල ධාරිතාව අනුව ක්‍රියාත්මක වීමේ හැකියාව, ගෝලීයකරණ ප්‍රතිලාභ අත්විඳීමේ හැකියාව යනාදි වාසි රාශියක් මාර්ගගත අධ්‍යාපනයේ දී හඳුනාගත හැකි ය. දුර්වල සන්නිවේදනය, හුදෙකලා බව, මූල්‍යමය ඌනතාවයන්, ගුණාත්මක බව කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කිරීම, සන්නිවේදන පහසුකම් හිඟ ප්‍රදේශවලට ප්‍රවේශ වීමේ අපහසුව ආදී අවාසි රැසක් ද මාර්ගගත අධ්‍යාපනයේ හඳුනාගත හැකි ය. මනෝවිද්‍යාත්මක වශයෙන් ද මාර්ගගත අධ්‍යාපනය මගින් පුද්ගලයින්ට අහිතකර බලපෑම් එල්ල කරන බව පර්යේෂණවලින් අනාවරණය වී ඇත. තාක්ෂණික දෝෂ මත කලකිරීම, පරිගණක බිය, කාංසාව, ආතතිය, මානසික අවපීඩනය, ටෙක්නොෆෝබියාව, නින්ද නොලැබීම නිසා ඇතිවන මානසික අවපීඩනය, අධික දත්ත පරිහරණය මගින් ඇතිකරන මානසික අවපීඩනය, අහිතකර හා තාවකාලික මාර්ගගත මිතු සබඳතා වැනි මානසික ආබාධ රාශියක් ද හඳුනාගත හැකි ය (Dhull, 2019).

කොවිඩ්-19 සමයේ දී සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශයේ අධ්‍යයන කටයුතු යාවත්කාලීන කොට පවත්වාගෙන යාම සඳහා මෙකී ප්‍රවේශ භාවිත කිරීම නිරීක්ෂණය කළ හැකි විය. මේ සම්බන්ධව ධනාත්මක මෙන්ම සෘණාත්මක ප්‍රතිචාර ද නිරීක්ෂණය කළ හැකි විය.

■ ප්‍රාසාංගික කලාවන් හා හරතනාට්‍යම් නර්තන ශෛලියේ ස්වභාවය

ගායනය, රංගනය වලනය පදනම් කරගෙන ශිල්පියාගේ පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් රංග භූමියක කෙරෙන නිරූපණ කලාව ප්‍රාසාංගික කලාව ලෙසින් හැඳින් වේ (Coogan, 2020). මේ සඳහා නර්තනය නාට්‍ය හා සංගීත යන කලා මාධ්‍යයන් ප්‍රාසාංගික කලාවන් යන්නට අයත් වේ. අභිවාහකයා හෝ නළුවා ප්‍රාසාංගික කලාවේ මූලිකම සාධකය වන අතර ඔහුගේ ප්‍රධානතම මෙවලම සිය ශරීරය වේ. සතර අභිනය භාවිත කිරීම ප්‍රාසාංගික කලාවේ මූලික ලක්ෂණයකි. සජීවී රංගනයක් වීම හා සජීවී ප්‍රේක්ෂක සමූහයක් සිටීම ද ප්‍රමුඛ ලක්ෂණයක් ලෙස සැලකේ. එමෙන්ම නිශ්චිත වේදිකාවක් හෝ ස්ථානයක රඟ දැක්විය යුතුය. තම මාධ්‍යයට අදාළ ශිල්ප ධර්ම ශික්ෂණයකින් හා අපූර්වත්වයෙන් යුතුව ඉදිරිපත් කළ යුතුය. මනා ප්‍රාසාංගිකත්වයෙන් යුක්ත විය යුතුය. ප්‍රාසාංගික කලාව විනෝදාස්වාදය ලබා දෙන්නක් විය යුතුය (ජයතුංග, 2020).

හරතනාට්‍යම් නර්තනය භාරතීය සම්භවයක් සහිත නර්තන ශෛලියකි. දකුණු ඉන්දියාවේ තමිල්නාඩුව මූලික කොටගෙන ප්‍රභවය ලබා ඇති හරතනාට්‍යම් නර්තනය ලෝකය පුරා විද්‍යාර්ථීන් විසින් අධ්‍යයනය කරනු ලබන විශ්වීය නර්තන ශෛලියක් ලෙස වර්තමානය වන විට පත්ව ඇත. හරතනාට්‍යම් නර්තනයට භාව, රාග, තාල යන ත්‍රිවිධ අංගයම අයත් වන අතර ඒ සියල්ල නර්තන ශිල්පියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ය. එමෙන්ම සෑම විටම ගුරුවරයා අභිමුඛව ගුරුවරයා අනුකරණය කරමින් මෙම විෂයයන් ඉගෙනගත යුතු වේ. ශිෂ්‍යයා විසින් ගුරුවරයා අනුකරණය, අනුගමනය කරන ආකාරය හා ඇසුරු කරන ආකාරය ශිෂ්‍යයාගේ ශිල්පීය ශක්‍යතාව කෙරෙහි ප්‍රබල ලෙස බලපාන අතර අතීතයේ පටන්ම හරතනාට්‍යම් හා කථක් නර්තනයේ දී ගුරුවරයා ප්‍රමුඛ කොට සැලකීම සිරිතක්ව පැවතිණ.

ඉතා අලංකාර හා සංකීර්ණ චලන රටාවකින් යුත් මෙම නර්තන ශෛලිය දැඩි විනයක් යටතේ බොහෝ කාලයක් පුරා පුගුණ කළ යුතු නර්තනයකි. භාරතනාට්‍යම් නර්තනය හා බැඳි තට්ටඩව්, නාට්ටඩව්, දෘෂ්ටි භේද, පාද භේද, ගීුවා භේද, ශිරෝ භේද, සම්යුත හස්ත, අසම්යුත හස්ත, හස්ත විනයෝග, රස-භාව පුකාශන යනාදි විශාල වපසරියකින් යුත් තාක්ෂණික ශිල්ප කුම හා විෂය අන්තර්ගතයක් සහිත ය. එමෙන්ම පුෂ්පාංජලි, අලාරිප්පු, ජතිස්වරම්, ශබ්දම්, වර්ණම්, පදම්, තිල්ලානා, ශ්ලෝකම්, කීර්තනම්, කෞතුවම්, ජාවලි, අෂ්ටපදි, දිව්‍ය පුබන්ධම් ආදි නර්තනාංග හරතනාට්‍යම් නර්තනයේ ව්‍යවහාර වන අතර මෙම නර්තන ශෛලිය හදාරන සෑම විද්‍යාර්ථියෙකු විසින් ම මෙම සියලු නර්තනාංග උගත යුතුය.

ඡායාරූපය 1 - දක්ෂිණ භාරතීය හරතනාට්‍යම් නර්තනය
(සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2014-2015 අධ්‍යයන කණ්ඩායමේ හරතනාට්‍යම් නර්තනය පිළිබඳ පුාසංගික කලාවේදී විශේෂ උපාධිය හැදෑරූ විද්‍යාර්ථීන්)

හරතනාට්‍යම් නර්තන ශෛලියේ දී මූලික රංග අනුපිළිවෙළ සඳහා පුෂ්පාංජලි, අලාරිප්පු, ජෙතිස්වරම්, ශබ්දම්, වර්ණම්, පදම්, තිල්ලානි, ශ්ලෝකම් යන නර්තන අංග ඇතුළත් වේ. මෙම නර්තනාංගයන්හි ස්වභාවය පහත පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකි ය.

වගුව අංක 1 : හරතනාට්‍යම් නර්තනයේ මූලික නර්තනාංග හා එහි ස්වභාවය

නර්තනාංගය	නෘත / නෘත්‍ය ගණය	නර්තනයේ ස්වභාවය
පුෂ්පාංජලි	නෘත හා නෘත්‍ය ලක්ෂණ සහිතය	නර්තන ශිල්පියා වේදිකාවට පිවිසෙන නර්තනාංගය මෙය වේ. පුෂ්ප සමුහයක් දෑතින් ගත් නර්තන ශිල්පියා නර්තනය කරමින් වේදිකාවට පිවිස නෘත කොටස් කිහිපයක් නර්තනය කොට දෑතින ගත් පුෂ්ප දෙවියන් වෙත පිදීම මෙම නර්තනය මගින් සිදු වේ.

අලාරිප්පු	නෘත	මෙම නර්තනය මගින් සිදු වනුයේ නර්තන ශිල්පියා සිය ශරීරය දෙවියන් වෙත පුද කිරීම යි. දොහොත් මුදුන් බැඳ ශිල්පියා නර්තනය ආරම්භ කරයි.
ජෙතීශ්වරම්	නෘත	ස්වර සංගීත සංයෝජනයන්ට අනුව ජති හෙවත් නර්තන මාතුා නර්තනය කිරීම මෙම නර්තනයේ ස්වාභාවය යි.
ශබ්දම්	නෘත්‍ය ලක්ෂණ බහුල වේ	දේව සංකල්ප (උදා: කිෂ්ණ දෙවියන්) සහිත කතා තේමාවක් පාදක කරගනිමින් එම කථා පුවත අභිනයානුසාරයෙන් ඉදිරිපත් කිරීම මෙම නර්තනයේ ස්වාභාවය යි. රස හා භාව පුකාශනයෙහිලා මෙම නර්තනයේ දී පුමුඛත්වය දෙනු ලැබේ.
වර්ණම්	නෘත හා නෘත්‍ය ලක්ෂණ සහිතය	හරතනාටා‍ම් නර්තනයේ දීර්ඝතම හා සංකීර්ණතම නර්තන විශේෂය වර්ණම් ය. විනාඩි හතළිහක් පමණ නොකඩවා නර්තනයේ යෙදීමත් ශිල්පියා දක්ෂතා පුදර්ශනය කිරීමටත් මෙම නර්තනාංගයේ දී සිදු වේ. දෙවියන් පාදක කතා පුවතක් අභිනයානුසාරයෙන් ඉදිරිපත් කිරීමත් අතරතුර දීර්ඝ ජති නර්තනය කිරීමත් මෙම නර්තනයේ දී සිදු වේ.
පදම්	නෘත්‍ය	දෙවියන් පාදක කතා පුවතක් අභිනයානුසාරයෙන් ඉදිරිපත් කිරීම මෙහි දී සුදුසු වන අතර භාව පුකාශනයෙහිලා පුමුඛත්වය හිමි වේ.
තිල්ලානා	නෘත ලක්ෂණ බහුල වේ	වේගවත් වුත් සංකීර්ණ වුත් වලන සහිත මෙම නර්තනය මගින් නෘත වලන සුන්දරත්වය ඉදිරිපත් කරනු ලැබේ.
ශ්ලෝකම්	නෘත්‍ය	හරතනාටා‍ම් රංග අනුපිළිවෙළෙහි අවසන් අංගය මෙය වන අතර දෙවියන්ට ස්තුති කිරීම හා ආචාර කිරීම පිළිබිඹු කරයි.

භාරතීය නාට්‍ය ශාස්තු සිද්ධාන්තයන්ට අනුව නර්තනය නෘත, නෘත්‍ය, නාට්‍ය යන තිුවිධාංගයෙන් සමන්විත වේ. නෘත යනුවෙන් හැඳින්වෙන්නේ හුදු නර්තනය හෙවත් රිද්මයානුකූල ගාතා වික්ෂේපයන් ය. නෘත්‍ය යනුවෙන් හැඳින්වෙන්නේ ආංගිකාභිනය මාර්ගයෙන් කිසියම් භාවයක් පුකාශ වන නර්තනාංගයන් ය. සතර අභිනයෙන් යුක්ත වූ කල නාට්‍ය වශයෙන් හඳුන්වනු ලැබේ (සරච්චන්දු, 2019).

හරතනාටා‍ම් නර්තන ශෛලිය දේවදාසි නර්තන සම්පුදායයෙන් පුභවය වුවකි. පුරාණයේ පටන්ම ගුරුකුල අධ්‍යාපනය ඔස්සේ විකාශය වූ හරතනාටා‍ම් නර්තනය වර්තමානය වන විට භාරතය ඉක්මවා ගොස් ලෝකයේ විවිධ ජාතීන් විසින් අධ්‍යයනය කරනු ලබන ගෝලීය නර්තන ශෛලියක් බවට පත්ව ඇත. ගුරු ගෝල සම්බන්ධතාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන මෙම නර්තන ශෛලියේ දී ගුරුවරයා දෙවියන් සේ සලකා නර්තනය හා සම්බන්ධ සිරිත් විරිත් සංස්කෘතික ලක්ෂණ ආදී සමස්ත දැනුම් සම්භාරය ගුරුවරයා වෙතින් ඉගෙන ගනී.

- **සාම්ප්‍රදායික භරතනාට්‍යම් නර්තන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කොවිඩ්-19 වසංගත සමයේ දී මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලියක් දක්වා යාවත්කාලීන වීම**

ශ්‍රී ලංකාවේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශය මඟින් භරතනාට්‍යම් නර්තනය පිළිබඳ විශේෂවේදී උපාධි පිරිනමනු ලබන අතර වර්තමානයේ දී එහි ශිෂ්‍යයන් 20 දෙනෙකු පමණ භරතනාට්‍යම් නර්තනය හදාරනු ලබයි. විශ්වවිද්‍යාල අධ්‍යාපන පද්ධතියේ දී සාම්ප්‍රදායික ලෙස දේශන ශාලාව තුළ දී ගුරුවරයා යටතේ දැඩි විනයක් පවත්වා ගනිමින් භරතනාට්‍යම් නර්තනය හදාරනු ලබ යි. භරතනාට්‍යම් නර්තනය ඉගැන්වීමේ දී බහුලව භාවිත කරනු ලබන ඉගෙන්වීම් ක්‍රමවේදයන් වන්නේ අනුකරණ ක්‍රමය, පියවර ක්‍රමය, දේශන ක්‍රමය හා කැඩපත් ක්‍රමය යි. අනුකරණ ක්‍රමය යටතේ දී ගුරුවරයා විසින් අදාළ නර්තන කොටස පියවරෙන් පියවර නර්තනය කර දැක්වීමෙන් අනතුරුව ශිෂ්‍යයා විසින් එය අනුකරණය කරමින් පියවරෙන් පියවර අධ්‍යයනය කරමින් ඉගෙන ගනී. ගුරුවරයා විසින් ශිෂ්‍යයාගේ හස්ත පාද පිහිටීම්වල නිශ්චිත ප්‍රමාණයන් හා ඒවාහි නිරවද්‍යතාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් නිරන්තරයෙන් තත්ත්ව පාලනයක් සිදු කරනු ලබ යි. තවත් අවස්ථාවක දී ගුරුවරයා ශිෂ්‍යයන් ඉදිරියේ කැඩපතක් මෙන් සිටිමින් ශිෂ්‍යයන් සමඟ අදාළ නර්තන කොටස රඟ දක්වනු ලැබේ. එවිට ශිෂ්‍යයන් ස්වකීය ශිල්පීය කුසලතා වර්ධනය කර ගනිමින් අඩුපාඩු මගහරවා ගනිමින් නර්තනය ඉගෙන ගනු ලැබේ. සාම්ප්‍රදායික පංති කාමරයේ දී ශිෂ්‍යයාට සිය හස්ත පාද නිවැරදිව සකස් කරගත යුතු ආකාරය පිළිබඳව භෞතික පරිසරයක සිට උපදෙස් ලැබේ. එමෙන්ම ගුරුවරයා විසින් ම ශිෂ්‍යයාගේ හස්ත පාද පිහිටිය යුතු ආකාරය සකස් කිරීම ද සාම්ප්‍රදායික දේශන ශාලාවේ දී සිදු වේ. සාම්ප්‍රදායික දේශන ශාලාව නර්තන පුහුණුවීම් වෙනුවෙන් ම කැඩපත් සවිකරන ලද පුවරු, විද්‍යානුකූලව සකස් කරන ලද දව ඇතිරූ පොළ, බාහිර ශබ්ද ඇතුල්වීම වළක්වන බිත්ති (Soundproof wall), ශබ්ද විකාශන පහසුකම්, බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර, පරිගණක සහ අන්තර්ජාල පහසුකම් ආදියෙන් සමන්විත ය. එමෙන්ම භරතනාට්‍යම් නර්තන නිර්මාණ අත්හදා බැලෙන අති නවීන ආලෝකකරණ මෙවලම් හා තාක්ෂණයෙන් පරිපූර්ණ වේදිකා පහසුකම් ද සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ට හිමි වේ.

කොවිඩ්-19 සමයේ දී මාර්ගගත ප්‍රායෝගික දේශන පවත්වනු ලැබුවේ දේශකවරයාට පහසු ස්ථානයක සිට දේශනය පවත්වන අතරතුර ශිෂ්‍යයන් සිය නිවෙස්වල දී අවශ්‍ය ඉඩ පහසුකම් සකස් කරගනිමින් දේශනයට සහභාගී වන ආකාරයට ය. දේශකවරයා සාම්ප්‍රදායික දේශනශාලාවේ දී දේශන සිදු කිරීමේ දී භාවිතයට ගන්නා ලද පියවර ක්‍රමය (සම්පූර්ණ නර්තන පද බණ්ඩයක් කොටස් වශයෙන් අධ්‍යයනය කර පසුව සම්පූර්ණ නර්තන බණ්ඩය ඉදිරිපත් කිරීම) බොහෝ දුරට සිය දේශන සඳහා භාවිතයට ගන්නා ලදි. එමෙන්ම අනුකරණය සහ කැඩපත් ක්‍රමය ද භාවිතයෙන් ප්‍රායෝගික දේශන ඉදිරිපත් කරන ලදි. පුහුණුවීම් නිවැරදි දැයි පරීක්ෂා කිරීම සඳහා දේශන පවත්වන අතරතුර ඒකල වශයෙන් ශිෂ්‍යයන්ට තමන් උගත් නර්තන කොටස ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙමින් ඒ මොහොතේම එය ඇගයීමත්, ශිෂ්‍යයන්ගේ නර්තන පුහුණුවීම් සහිත විද්‍යුත්පට ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හරහා ලබා ගනිමින් ඇගයීමට ලක් කර ප්‍රතිපෝෂණ ලබා දීමත් සිදු විය.

මාර්ගගත දේශන ශිෂ්‍යයන් වෙත රැගෙන යාම සඳහා ZOOM, GOOGLE MEET යන මාධ්‍යාංග භාවිත කරන ලද අතර සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය ද භාවිතයට ගන්නා ලදී. ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය ඔස්සේ දේශනවලට අදාළ විද්‍යෝපපට, ශ්‍රව්‍ය ආධාරක සහ පාඩම් සටහන් පත්‍රිකා ආදී ඉගෙනුම් ආධාරක ශිෂ්‍යයන්ට ලබා දෙන ලදී.

දත්ත විශ්ලේෂණය

සමස්තයක් ලෙස මෙම මාර්ගගත නර්තන ඉගෙනුම් ක්‍රියාවලිය ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශයේ සිසුන් ලද ප්‍රථම මාර්ගගත ඉගෙනුම් අත්දැකීම වූ අතර ආගන්තුක ඉගෙනුම් ක්‍රමයක් වීම හා එහි ඇතැම් අංග නර්තන විෂයට ගලපා ගැනීම අසීරු බැවින් ශිෂ්‍යයන් විවිධ සංකුලතාවන්ට මුහුණ දුන් බව හඳුනාගත හැකි විය. මාර්ගගත හරතනාට්‍යම් නර්තන අධ්‍යයන ක්‍රියාවලිය පිළිබඳ ශිෂ්‍යයන්ගේ තෘප්තිමත්භාවය හා ඔවුන් මුහුණු දුන් ගැටලු අනාවරණය හා තහවුරු කර ගැනීම පිණිස නර්තනය හා සම්බන්ධ විවිධ ක්ෂේත්‍ර අළලා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරන ලද අතර එහි ඇතුළත් වූ ප්‍රශ්න හා ප්‍රතිචාර පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව පහත පරිදි වේ.

වගුව අංක 2 ඃ හරතනාට්‍යම් නර්තනය මාර්ගගතව හදාරණ ලද ශිෂ්‍යයන්ට ඉදිරිපත් කරන ලද ප්‍රශ්න සහ ප්‍රතිචාර

ප්‍රශ්න අංකය	ප්‍රශ්නය	ඔව්	නැත
01	මාර්ගගත ක්‍රමයේ දී ශාරීරිකව හා භෞතික වශයෙන් ගුරුවරයා හා ශිෂ්‍යයා අතර සම්බන්ධතාවක් නොපවතින හෙයින් විද්‍යාර්ථීයාගේ ශාස්ත්‍රීය දැනුමෙහි ගුණාත්මක බවට බලපෑම් එල්ල වේ ද	80%	20%
02	හරතනාට්‍යම් නර්තනයේ දී හස්ත පාද දෘෂ්ටි ආදී ශරීරාංග අතර පවත්වාගත යුතු සම්බන්ධතාව දෘෂ්ටි භේද, පාද භේද, ග්‍රීවා භේද, ශිරෝ භේද, සම්යුත හස්ත, අසම්යුත හස්ත, හස්ත විනයෝග, රස-භාව ප්‍රකාශන පිළිබඳ උපදෙස් මාර්ගගත ක්‍රමයට ලබා දීම ප්‍රායෝගික ගැටලු ඇති වේ ද?	80%	20%
03	රස භාව ප්‍රකාශ කිරීම සජීවී පරිසරයක සිට පුහුණු විය යුතු අතර මාර්ගගත පුහුණු වීමේ දී පරිගණක තිරය මගින් එය පැහැදිලි ලෙස දිස් නොවීමේ ගැටලු ඇති වේ ද?	70%	30%
04	හරතනාට්‍යම් නර්තනය හා බැඳි සංස්කෘතික ලක්ෂණ ශිෂ්‍යයින්ට පවරා දීම මාර්ගගත හා අතත්‍ය ඉගෙනුම් පරිසරයක දී ප්‍රායෝගිකව ගැටලු ඇති වේ ද?	90%	10%
05	වර්ණම් වැනි දීර්ස හා සංකීර්ණ නර්තනාංග සහිත දේශන ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික ගැටලු ඇති වේ ද?	100%	

06	හරතනාට්‍යම් නර්තනය වැනි ප්‍රායෝගික විෂයක් මාර්ගගත දේශන ඔස්සේ	100%	
07	හරතනාට්‍යම් නර්තන විෂය මගින් ඇති කිරීමට අපේක්ෂිත මෘදු කුසලතා මාර්ගගත අධ්‍යාපනයේ දී ශිෂ්‍යයා තුළ ස්ථාපිත කිරීමට බාධාවක් සිදු වේ ද?	90%	10%
08	ප්‍රාසාංගික කලාවන් ආශ්‍රිත ඉගැන්වීම් ශිල්ප ක්‍රම භාවිත කිරීමේ දුෂ්කරතාවන් ඇති වේ ද?	80%	20%
09	නර්තන පුහුණුවීම් සඳහා විශේෂයෙන් සකස් කළ දේශනශාලාවල පුහුණුව අහිමි වේ ද?	100%	
10	ටෙක්නොලෝජියා හා මානසික ආතතිය හා සන්නිවේදන ගැටලු ඇති වේ ද?	100%	

ප්‍රස්තාර අංක 1 : හරතනාට්‍යම් නර්තනය මාර්ගගතව ඉගෙනීමේ දී ඇතිවන ප්‍රායෝගික ගැටලු විශ්ලේෂණය

■ හරතනාට්‍යම් නර්තනය මාර්ගගතව ඉගෙනීමේ දී ඇතිවන ප්‍රායෝගික ගැටලු විශ්ලේෂණය

අප විසින් මෙම පර්යේෂණයේ දී ශිෂ්‍යයන්ට ලබාදුන් ප්‍රශ්නාවලිය හා ඔවුන් අතරින් අහඹු ලෙස තෝරාගත් විද්‍යාර්ථීන් තිදෙනකු සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා මෙන්ම මෙම මාර්ගගත නර්තන අධ්‍යයන ක්‍රියාවලියට සහභාගී වෙමින් ලද සහභාගීත්ව නිරීක්ෂණ මගින් එක්රැස් කරගන්නා ලද දත්ත උපයෝගී කර ගනිමින් ශිෂ්‍යයන් මුහුණ දෙන ගැටලු දහයක් හඳුනාගන්නා ලද අතර එම ගැටලු හේතුවෙන් ප්‍රාසාංගික කලා විෂය ක්ෂේත්‍රයේ උද්ගත වන අභියෝග පහත පරිදි විශ්ලේෂණය කරනු ලැබේ.

■ මාර්ගගත ක්‍රමයේ දී ශාරීරිකව හා භෞතික වශයෙන් ගුරුවරයා හා ශිෂ්‍යයා අතර සම්බන්ධතාවක් නොපවතින හෙයින් විද්‍යාර්ථියාගේ ශාස්ත්‍රීය දැනුමෙහි ගුණාත්මක බවට බලපෑම් එල්ල කිරීම

මාර්ගගත භරතනාට්‍යම් නර්තන ඉගෙනුමට සහභාගී වූ ශිෂ්‍යයන්ගෙන් 80%කට මෙම ගැටලුව උද්ගත වූ බව ඔවුන් ප්‍රශ්නාවලියට දක්වන ලද ප්‍රතිචාරයන්ගෙන් තහවුරු වේ. භරතනාට්‍යම් වැනි සංකීර්ණ ශාස්ත්‍රීය පදනමක් සහ සියුම් ලක්ෂණ සහිත නර්තන ශෛලියක් ඉගෙනීමේ දී ගුරුවරයා යටතේ දැඩි විනයක් පවත්වා ගනිමින් උගත යුතු අතර ගුරුවරයා හා ශිෂ්‍යයා අතර පවතින අන්‍යෝන්‍ය සබඳතාවෙහි ප්‍රබලත්වය නර්තනයේ ගුණාත්මක බව කෙරෙහි සෘජුවම බලපායි. භරතනාට්‍යම් වැනි නර්තන ශෛලියක් ඉගෙනීමේ දී අනුකරණය යන ශිල්ප ක්‍රමය ඉතා වැදගත් වන අතර ශිෂ්‍යයා විසින් සිය ගුරුවරයා අධ්‍යයනය කරමින් ගුරුවරයාගේ නර්තන හැඩතල ශාස්ත්‍රීය අවේණිකත්වයන් තමා තුළ ස්ථාපිත කරගත යුතු ය. මෙය භරතනාට්‍යම් වැනි සම්භාව්‍ය නර්තන ශෛලියක පැවැත්ම කෙරෙහි ද ඉතා ප්‍රබල වශයෙන් බලපානු ලබ යි.

■ භරතනාට්‍යම් නර්තනයේ දී හස්ත පාද දෘෂ්ටි ආදි ශරීරාංග අතර පවත්වාගත යුතු සම්බන්ධතාව දෘෂ්ටි හේද, පාද හේද, ග්‍රීවා හේද, ශිරෝ හේද, සම්‍යුත හස්ත, අසම්‍යුත හස්ත, හස්ත විනියෝග, රස-භාව ප්‍රකාශන පිළිබඳ උපදෙස් මාර්ගගත ක්‍රමයට ලබා දීම ප්‍රායෝගික නොවීම

මාර්ගගත භරතනාට්‍යම් නර්තන ඉගෙනුමට සහභාගී වූ ශිෂ්‍යයන්ගෙන් 80%කට මෙම ගැටලුව උද්ගත වූ බව ඔවුන් ප්‍රශ්නාවලියට දක්වන ලද ප්‍රතිචාරයන්ගෙන් තහවුරු වේ. භරතනාට්‍යම් නර්තනයේ යෙදෙන මෙවැනි ප්‍රායෝගික විෂය කොටස් සාම්ප්‍රදායික පන්ති කාමරයේ දී ගුරුවරයා ශිෂ්‍යයන් ඉදිරියේ නර්තන කොටසට අදාළ මාර්ගෝපදේශයන් හා උපදෙස් සජීව ලබා දෙන අතර එම කොටස නර්තනය කර දක්වයි. පසුව ශිෂ්‍යයන් විසින් එය නැවත ඉදිරිපත් කිරීමෙන් නර්තනය ඉගෙන ගනී. එහෙත් මාර්ගගත ක්‍රමයේ දී ගුරුවරයා හා ශිෂ්‍යයා වෙන්ව සිටීම හේතුවෙන් මෙම උපදෙස් ලබා දීමේ හා ලබා ගැනීමේ ක්‍රියාවලිය නිසි ආකාරයෙන් සිදු නොවීමෙන් ශිෂ්‍යයා තුළ වැරදි ඉරියව් නිර්මාණය විය හැකි අතර මෙය ප්‍රාසාංගික කලා විෂයන්ගේ ශාස්ත්‍රීය ආවේණිකත්වය හා පැවැත්මට අහිතකර විය හැකි ය.

■ රස භාව ප්‍රකාශ කිරීම සජීවී පරිසරයක සිට පුහුණු විය යුතු අතර මාර්ගගත පුහුණු වීමේ දී පරිගණක තිරය මගින් එය පැහැදිලි ලෙස දිස් නොවීම

මාර්ගගත භරතනාට්‍යම් නර්තන ඉගෙනුමට සහභාගී වූ ශිෂ්‍යයන්ගෙන් 70%කට මෙම ගැටලුව උද්ගත වූ බව ඔවුන් ප්‍රශ්නාවලියට දක්වන ලද ප්‍රතිචාරයන්ගෙන් තහවුරු වේ. භරතනාට්‍යම් නර්තනයේ දී රස-භාව ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියට, මුහුණ ප්‍රධාන තැනක් ගන්නා බැවින් රස-භාව ප්‍රකාශ කිරීමේ දී මුහුණේ සිදුවන කෙටි මාංශ පේශි වලනයක් වුව ද ශිෂ්‍යයා විසින් නිසි ආකාරයෙන් උගත යුතුය. එහෙත් මාර්ගගත ඉගෙනුමේ දී පරිගණක තිරය හෝ ස්මාර්ට් ජංගම දුරකථනයේ තිරය මගින් එය සිදු

කිරීම අපහසු කාර්යයකි. සන්නිවේදන දුර්වලතා හේතුවෙන් රූප රාමු අපැහැදිලි වීම, වරින් වර සිදුවන සන්නිවේදන බිඳවැටීම් හේතුවෙන් රස-භාව ක්‍රියාවලිය ඒකීයව පවත්වා ගැනීමේ අපහසුතාව යන ගැටලු මාර්ගගත හරතනාට්‍යම් ඉගෙනුමේ දී සිදු වේ.

- හරතනාට්‍යම් නර්තනය හා බැඳි සංස්කෘතික ලක්ෂණ ශිෂ්‍යයින්ට පවරා දීම මාර්ගගත හා අතථ්‍ය ඉගෙනුම් පරිසරයක දී ප්‍රායෝගිකව සිදු නොවේ

මාර්ගගත හරතනාට්‍යම් නර්තන ඉගෙනුමට සහභාගී වූ ශිෂ්‍යයන්ගෙන් 90%කට මෙම ගැටලුව උද්ගත වූ බව ඔවුන් ප්‍රශ්නාවලියට දක්වන ලද ප්‍රතිචාරයන්ගෙන් තහවුරු වේ. හරතනාට්‍යම් නර්තනය හා බැඳි ආගමික පසුබිම, සදාචාරාත්මක ලක්ෂණ, සාරධර්ම ආචාරධර්ම යනාදි අගයන් මෙන්ම නර්තන ගුරුකුලයේ පවත්නා සංස්කෘතිය පවරා දීමට මාර්ගගත අධ්‍යාපනය බාධා ඇති කරයි. ගුරු-සිසු සබඳතාව බිඳ වැටීම, ගුරු ගෞරවය බිඳ වැටීම, අනොන්‍ය වශයෙන් එකිනෙකා අතර පවතින සුහදතාව, ඒකීයත්වය, අනොන්‍ය ගෞරවය වැනි සංකල්ප මාර්ගගතව ක්‍රියාත්මක නොවන බැවින් සංස්කෘතික ලක්ෂණ පවරා දීමේ දී මාර්ගගත ඉගෙනුම සුදුසු නොවේ.

- වර්ණම් වැනි දීර්ඝ හා සංකීර්ණ නර්තනාංග සහිත දේශන ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික ගැටලු

මාර්ගගත හරතනාට්‍යම් නර්තන ඉගෙනුමට සහභාගී වූ ශිෂ්‍යයන් සියලු දෙනාට ම මෙම ගැටලුව උද්ගත වූ බව ඔවුන් ප්‍රශ්නාවලියට දක්වන ලද ප්‍රතිචාරයන්ගෙන් තහවුරු වේ. වර්ණම් නර්තනාංගයක් විනාඩි 30-40ක් වැනි කාල පරාසයක් දක්වා නර්තනය කරන අතර හරතනාට්‍යම්හි අනෙකුත් නර්තන අංග ද අවම විනාඩි 20 පමණ රග දක්වනු ලැබේ. එබැවින් එම නර්තනාංග මාර්ගගත ඉගෙනීම සඳහා බොහෝ වේලාවක් ගතවන බැවින් සන්නිවේදන පහසුකම් සපයා ගැනීමේ දී අධික පිරිවැයක් දැරීමට සිදු වනවා සේම කාල කළමණාකරණයේ ගැටලු ඇතිවිය හැකි ය. සාමාන්‍යයෙන් එක් නර්තන අංගයක්/විෂය ඒකකයක් සඳහා අවම පැය 6ක කාලයක් පාඨමාලාව සඳහා ඇතුළත් කර ඇති අතර එම විෂය ඒකකය මාර්ගගතව හැදෑරීමේ දී ඊට වඩා වැඩි කාලයක් ගතවන බැවින් (දීර්ඝ උපදේශන ක්‍රියාවලිය, සන්නිවේදන බාධා ඇති වීම මගින් විටින් විට සබඳතාව ඇණ හිටීම ආදි හේතුන් මත) හරතනාට්‍යම් නර්තනය මාර්ගගතව හැදෑරීමේ ප්‍රායෝගිකතාව අවම වේ.

- හරතනාට්‍යම් නර්තනය වැනි ප්‍රායෝගික විෂයක් මාර්ගගත දේශන ඔස්සේ ඉගෙනීමේ දී යොදා ගනු ලබන තාක්ෂණික මෙවලම්හි (ජංගම දුරකථන, පරිගණක) දර්ශන තලවල ප්‍රමාණය පටුවීම හේතුවෙන් මාර්ගගත ප්‍රායෝගික දේශනවල දී දේශකයා පැහැදිලි ලෙස දිස්වීම සිදු නොවේ

මාර්ගගත හරතනාට්‍යම් නර්තන ඉගෙනුමට සහභාගී වූ සියලු ම ශිෂ්‍යයන්ට මෙම ගැටලුව උද්ගත වූ බව ඔවුන් ප්‍රශ්නාවලියට දක්වන ලද ප්‍රතිචාරයන්ගෙන් තහවුරු වේ.

නර්තනයේ දී අවකාශය තුළ විවිධ දිශාවන්ට හස්ත පාද පැතිරෙන බැවින් දර්ශන තලයේ පටු බව දේශකයාගේ ඉදිරිපත් කිරීම හා හස්ත පාදවල පිහිටීම තාක්ෂණික මෙවලම් ඔස්සේ මනාව ශිෂ්‍යයා වෙත ගුහණය නොවීමට හේතු විය හැකි ය. ශිෂ්‍යයා භාවිත කරන පරිගණක හෝ දුරකථනයේ දර්ශන තලය තුළ දේශකයාගේ හස්තයෙහි එක් කොටසක් පමණක් පෙනීම, දේශකයාගේ පාදයෙහි පිහිටීම ඔහු භාවිත කරන පරිගණකයේ කැමරාවට නාභිගත නොවීම යනාදි බාධාවන් මෙමගින් අවධාරණය කෙරේ. මෙමගින් ශිෂ්‍යයා හා දේශකයා අතර සිදුවන සන්නිවේදන ක්‍රියාවලියට බාධා පැමිණිය හැකි ය.

- **හරතනාට්‍යම් නර්තන විෂය මගින් ඇති කිරීමට අපේක්ෂිත මෘදු කුසලතා හා මාර්ගගත අධ්‍යාපනයේ දී ශිෂ්‍යයා තුළ ස්ථාපිත කිරීමට බාධාවක් වීම හා පෞරුෂ සංවර්ධන ගැටලු ඇති වීම වන බව හඳුනාගත හැකි ය**

මාර්ගගත හරතනාට්‍යම් නර්තන ඉගෙනුමට සහභාගී වූ ශිෂ්‍යයන්ගෙන් 90%කට මෙම තත්ත්වය ඇති විය හැකි බව පිළිගන්නා ලදි. ප්‍රාසාංගික කලා පාඨමාලාවන් මගින් විද්‍යාර්ථීන් තුළ ස්ථාපිත කිරීමට නියමිත ඉගෙනුම් එල රාශියකි. නිර්මාණශීලත්වය, ගැටලු නිරාකරණය, තර්කානුකූල චින්තනය, විචාරශීලීත්වය, සාමූහිකත්වය, ඉවසීම, වගකීම, වගවීම, මානවාහිමානයට ගරු කිරීම, සංවේදීතාව, චිත්තවේගීය බුද්ධිය, සන්නිවේදන ශක්‍යතා වැනි කුසලතා හා වටිනාකම් වර්ධනය ඒ අතර වේ (අබේපාල, 2019). මෙම කුසලතා වර්ධනය කර ගත යුත්තේ එම විෂයයන් නිශ්චිත ස්ථානයක එනම් නර්තන ශාලා, වේදිකා හෝ නර්තන පර්යේෂණාගාරවල සාමූහික හැදෑරීමෙන් ය. මාර්ගගත අධ්‍යාපනයේ දී භෞතික වශයෙන් සාමූහිකව කටයුතු කිරීමක් හෝ එකිනෙකා අතර අන්තර් ක්‍රියාකාරීත්වයක් සිදු නොවන බැවින් යථෝක්ත ඉගෙනුම් එල අත්පත් කර ගැනීම දුෂ්කර වේ (Liyanage, 2020). මෙමගින් දීර්ඝ කාලීනව පෞරුෂ සංවර්ධන ගැටලු ඇති විය හැකි ය.

- **ප්‍රාසාංගික කලාවන් ආශ්‍රිත ඉගැන්වීම් ශිල්ප ක්‍රම භාවිත කිරීමේ දුෂ්කරතාවය**

මාර්ගගත හරතනාට්‍යම් නර්තන ඉගෙනුමට සහභාගී වූ ශිෂ්‍යයන්ගෙන් 80%කට මෙම ගැටලුව උද්ගත වූ බව ඔවුන් ප්‍රශ්නාවලියට දක්වන ලද පුතිචාරයන්ගෙන් තහවුරු වේ. ප්‍රාසාංගික කලාවන් ඉගැන්වීම සඳහා භාවිත කරනු ලබන නිදර්ශන ආශ්‍රිත ක්‍රම ශිල්ප, අනුකරණාත්මක ක්‍රම ශිල්ප, වාචික හෙවත් දේශනාත්මක ක්‍රම ශිල්ප, කණ්ඩායම් ක්‍රමය, පියවර ක්‍රමය, කැඩපත් ක්‍රමය, අභ්‍යාස ක්‍රමය (අබේපාල, 2019) යනාදි ඉගැන්වීම් ක්‍රමවේද මාර්ගගත ඉගෙනුමේ දී භාවිතය දුෂ්කර ප්‍රායෝගිකත්වය අවම වන හෙයින් සාර්ථක ලෙස විෂය කරුණු විද්‍යාර්ථියාට ගුහණය කරගැනීම දුෂ්කර විය හැකි ය.

- ■ **නර්තන පුහුණුවීම් සඳහා විශේෂයෙන් සකස් කළ දේශන ශාලාවල පුහුණුව අහිමි වීම**

මාර්ගගත හරතනාට්‍යම් නර්තන ඉගෙනුමට සහභාගී වූ සෑම ශිෂ්‍යයෙකුට ම මෙම ගැටලුව උද්ගත වූ බව ඔවුන් ප්‍රශ්නාවලියට දක්වන ලද ප්‍රතිචාරයන්ගෙන් තහවුරු වේ. හරතනාට්‍යම් නර්තනය පුහුණු වීමට යෝග්‍ය නර්තන පුහුණු ශාලා භාවිත කළ යුතුය. එමෙන්ම එම නර්තනයන් වේදිකාවට උචිත පරිදි නිර්මාණය කිරීම සඳහා ද (අරංගේත්‍රුම් ප්‍රසංග) විෂය අන්තර්ගතයේ ඇතැම් ඒකක නිර්මාණය කර ඇති අතර නර්තන පුහුණු ශාලා, නර්තන පර්යේෂණාගාරවල, වේදිකාවලින් බැහැරව මාර්ගගත හා අත්‍යර්ථ ඉගෙනුම් පරිසරයක් තුළ එම පුහුණුවීම් සිදු කිරීමෙන් විද්‍යාර්ථීන්ට එම අත්දැකීම් අහිමි වීම සිදු වේ (Liyanage, 2020).

- ■ **ටෙක්නොෆෝබියා හා මානසික ආතතිය හා සන්නිවේදන ගැටලු**

මාර්ගගත හරතනාට්‍යම් නර්තන ඉගෙනුමට සහභාගී වූ සෑම ශිෂ්‍යයෙකුට ම මෙම ගැටලුව උද්ගත වූ බව ඔවුන් ප්‍රශ්නාවලියට දක්වන ලද ප්‍රතිචාරයන්ගෙන් තහවුරු වේ. මාර්ගගත අධ්‍යාපනයේ භාවිත තාක්ෂණය ආගන්තුක වීම, පරිගණක සාක්ෂරතාව නොමැති වීම, තාක්ෂණික ක්‍රම ඔස්සේ සිදු කරනු ලබන ඇගයීම් කටයුතු පිළිබඳ විශ්වසනීයත්වයක් නොමැති වීම, ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාව අවම මට්ටමක පවතින සිසුන්ට ඇතිවන භාෂාමය ගැටලු හා ටෙක්නොෆෝබියා හෙවත් තාක්ෂණයට දක්වන අනිසි බිය තත්ත්වයන් ද මෙම මාර්ගගත හරතනාට්‍යම් පාඨමාලාව සඳහා බාධා ඇති කරනු ලැබූ සාධකයන් ලෙස මෙම අධ්‍යයනයේ දී හඳුනාගනු ලැබීය. වරින් වර සන්නිවේදන බාධා ඇතිවීම සම්බන්ධතාව ඇණහිටීම වැනි සන්නිවේදන ගැටලු කිහිපයක් ද මේ සඳහා බලපෑම් කළ බව මෙම අධ්‍යයනයේ දී අනාවරණය විය. එම නිරන්තර සන්නිවේදන බිඳ වැටීම් හේතුවෙන් ඇතිවන අපේක්ෂා හංගත්වය මානසික ආතතියක් දක්වා ව්‍යාප්ත විය හැකි බව මෙම අධ්‍යයන ක්‍රියාවලිය පිළිබඳ සම්මුඛ සාකච්ඡාවල දී අනාවරණය විය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ අන්තර්ජාල සේවා සපයන ආයතනවලින් ප්‍රමාණවත් සේවාවක් නොලැබීමෙන් අබණ්ඩව සිදුවන සන්නිවේදන බිඳවැටීම් මේ සඳහා ප්‍රමුඛව බලපාන බව විද්‍යාර්ථීන්ගේ අදහස යි. ස්ථාවර හා අධිවේගී අන්තර්ජාල ප්‍රවේශයක් නොමැති වීම හේතුවෙන් කෝවිඩ්-19 වසංගත කාල සීමාවේ දී තෘතීයික අධ්‍යාපනය අබණ්ඩව පවත්වාගෙන යාම කෙරෙහි ඇති වූ ප්‍රමුඛතම අභියෝගය විය (Hayashi, R., Maddawin, A., Garcia, M., Hewagamage, K. P., 2020).

සමස්තයක් ලෙස මාර්ගගත හරතනාට්‍යම් නර්තන ඉගෙනුම සඳහා සහභාගී වූ සියලු ශිෂ්‍යයන්ට විවිධ ගැටලු හා අභියෝගවලට මුහුණ දීමට සිදු වී ඇති බව යථෝක්ත දත්ත විශ්ලේෂණයට අනුව පැහැදිලි වේ. එමෙන්ම සමස්ත මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳව ඔවුන්ගෙන් 80%ක් මධ්‍යස්ථ වශයෙන් තෘප්තිමත් වී ඇති අතර 20%ක් මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳ තෘප්තිමත් වී නොමැත.

ප්‍රස්තාර අංක 2 ඃ කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ති සමයේ දී මාර්ගගත ක්‍රමයෙන් හරතනාට්‍යම් නර්තනය හැදෑරීම පිළිබඳ ශිෂ්‍යයන්ගේ තෘප්තිමත් භාවය

■ **මාර්ගගත අධ්‍යාපනය සමග ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශයේ ඇති වූ නව ප්‍රවණතා**

